මහේස්ත්‍රාත් අධිකරණය
06 JUL 1987
අනුරාධපුරය

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1987 අංක 16 දරන
# පලාත් පාලන සේවා
# (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 අප්‍රේල් මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1987 අප්‍රේල් මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 30 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1987 අංක 16 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 අප්‍රේල් මස 16 වන දින.]

එල්. ඩී.—ඕ. 14/86 (iv)

**ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1987 අංක 16 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් වනු ලබන, 1985 අංක 10 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 2 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ එන "මහා නගර සභා, නගර සභා සහ සංවර්ධන සභා" යන වචන වෙනුවට "මහා නගර සභා, නගර සභා, සංවර්ධන සභා සහ ප්‍රාදේශීය සභා" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. 1985 අංක 10 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය, එහි එන "පළාත් පාලන ආයතනය" යන්නෙහි අර්ථකථනය වෙනුවට මෙහි පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

> '"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සංවර්ධන සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වේ ;"'.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.